**යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යපෘතිය - 2019**

**----------------------------------------------------------------------------------------------**

යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 - එස්ආර්අයි (සීඔඑල්) දරන ණය ගිවිසුමේ VI ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරික්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 09 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ප්‍රමුඛතා නාගරික ව්‍යාපෘති සඳහා ඉහල මට්ටමේ සූදානමක් ඇති කරගැනීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,879 කට සමාන එජඩො මිලියන 12.20 ක් වන අතර ඉන් රු.මිලියන 1,540 කට සමාන එජඩො මිලියන 10 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉන් රු.මිලියන 884 කට සමාන එජඩො මිලියන 5.74 ක් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණු අතර ඉතිරි මුදල නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් | නීතිමය හා බදු සම්බන්ධ ගැටළු පිළිබඳව | අදහස් දක්වා නොමැත. | මෙම අවශ්‍යතා සමඟ අනුගතවීමට කොන්ත්‍රාත්කරුවන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පනතේ 6(01)(අ) වගන්තිය | කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේවෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත් හා සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාව සමඟ අනුගත වී නොතිබුණි. | කොන්ත්‍රාත්කරුට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | | පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත | උපදේශක නිර්මාණයේදී හා මිලදී ගැනීමේදී විධිවිධාන අනුගමනය කර නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ නීතිමය අංශයෙන් බැහැර වේ. | අදහස් දක්වා නොමැත. | රීතීන් සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2019 මාර්තු 05 දිනැති 2019/1 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘතියේ සමාලෝචන කමිටුවේ රැස්වීම් මාස 02 කට වරක් පැවැත්විය යුතුය. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී එම රැස්වීම් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ නියාමන කටයුතු කාර්යක්ෂමව සිදු නොවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වීම අවශ්‍ය වේ. |
| (ඈ) | 2019 ජනවාරි 12 දිනැති 2019/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂය තුළ 04 ක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ නියාමන කටයුතු කාර්යක්ෂමව සිදු නොවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | විගණන හා කළමනාකරණ රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| උපදේශක ලෙස විදේශ බද්ධ ව්‍යාපාරයක කොටස්කරුවෙකු සමඟ පෞද්ගලික සමාගමක් තෝරාගෙන තිබුණු අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ලෙස රු.මිලියන 50.11 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව අවසන් වේ. | උප ව්‍යාපෘති හඳුනාගැනීමට අවශ්‍යතා තක්සේරුවක් සහ සංවර්ධන යෝජනා සකස් කර තිබුණි. | ව්‍යාපෘති කාලය තුළ අවශ්‍ය මට්ටම සහතික වෙමින් කඩිනමින් කටයුතු අවසන් කිරීමට උපදේශක පෙළඹවීමට පියවර ගත යුතුය. |

### 3.2 පද්ධති හා පාලනයන්

| අංකය | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | විමර්ශන වාර්තාව, මාසික වාර්තාව සහ කාර්තුමය වාර්තාව යනාදිය ලබාගැනීමකින් තොරව උපදේශක වෙත රු.මිලියන 5.92 ක් ගෙවා තිබුණි. | අවශ්‍ය මට්ටම සහතික වෙමින් කටයුතු කඩිනමින් අවසන් නොවේ. | විමර්ශන, මාසික හා කාර්තු වාර්තා ලැබීමට පෙර ගෙවීම් සිදුකර ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගෙවීම් සිදුකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති අධ්‍යක්ෂක හා ව්‍යාපෘති ගණකාධිකාරී පත්කර තිබුණද, සම්පූර්ණ කාර්යමණ්ඩලය සමඟ ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා පළාත් මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක පිහිටුවා නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව අවසන් වේ. | ජනාධිපතිවරණ සහ ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හේතුවෙන් පත්වීම් ලබාදීමට නොහැක. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සම්පූර්ණ කාර්ය මණ්ඩලය සමඟ ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |